**මහරගම නගර සභාව - 2020**

**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------------**

මහරගම නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මහරගම නගර සභාව මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතා අනුව ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූ පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 2.2 | අංක 607629 දරන ජංගම ගිණුම 2015 අගෝස්තු මාසයේදී වසා තිබුණද මුදල් යටතේ රු.2,052,258 ක නාමික වටිනාකමක් සමාලෝචිත වර්ෂයේදීද ගිණුමේ දක්වා තිබුණි. | නාමික වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 2155/7 හා 2019 දෙසැම්බර් 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පනවන ලද නගර සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ රීති අංක 84 හා පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය -2017 අනුව නගර සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සිදුකර නොතිබූ අතර ගිණුම් පවත්වාගෙන යාමට අවශ්‍ය ආකෘති පත්‍ර හා කේත අංකද භාවිතා කර නොතිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දුන් ආකෘතිපත්‍ර හා කේත අංක අනුව ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතය සහ අංක 2155/7 හා 2019 දෙසැම්බර් 24 දිනැති ගැසට් පත්‍රය මඟින් හඳුන්වා දී ඇති නියෝග අනුව කටයුතු කළ යුතුවේ. |
| ප්‍රවර්තන මූල්‍ය කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති සියළුම වටිනාකම් සඳහා, පෙර වූ සමාන කළ හැකි කාලපරිච්ඡේදයට සම්බන්ධ තුලනාත්මක තොරතුරු නගර සභාව විසින් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | තුලනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී සන්සන්දනය කිරීමට පහසුවන ආකාරයට සත්‍ය, අයවැයගත හා පෙර වර්ෂයේ සත්‍ය තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනැති හා අංක 4/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි, ආයතනය සතු සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය කිරිම සඳහා කමිටු 03 ක් පත්කර ඇත. සභාව සතු සියළුම වත්කම් මෙමඟින් ප්‍රත්‍යාගණනය කර 2021 මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමට කටයුතු කරන බව දන්වමි. | සියළු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | 2020 වර්ෂය තුළ සභා අරමුදලින් රු.149,509,028 ක් වැයකර ව්‍යාපෘති 186 ක වැඩ නිමකර තිබුණද එම ව්‍යාපෘතිවල වටිනාකම දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. 2021 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. | ඉදිකිරීම් නිම කළ සියළු වත්කම් ප්‍රාග්ධනීත කළ යුතුවේ. |
| (ඇ) | සභා අරමුදලින් ක්‍රියාත්මක නොනිමි ව්‍යාපෘති 23 ක වටිනාකම රු.20,034,000 ක් නොනිමි වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | මීට පෙර වර්ෂවල අවසන් ගිණුම් සකස් කිරීමේදී නොනිමි වැඩ ගිණුම්ගත නොකළ හෙයින් මෙම වර්ෂයේදීද ගිණුම්ගත කර නැත. 2021 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. | කෙරීගෙන යන වැඩ නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඈ) | කාර්යාල උපකරණ වාර්ෂිකව සියයට 12.5 බැගින් ක්ෂය කළ යුතු වුවත් රු.1,713,462 ක් වටිනා කාර්යාල උපකරණ සියයට 7.5 බැගින් ක්ෂය කිරීම නිසා වාර්ෂික ක්ෂය වටිනාකම රු.128,510 ක් වූයෙන් රු.85,672 කින් ක්ෂය වටිනාකම අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. 2021 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වමි . | නිවැරදිව ක්ෂය ප්‍රතිපත්තියට අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඉ) | අළුත්වැඩියාව හා නඩත්තු වියදම් රු.184,598,363 ක් වැඩියෙන් සටහන් කිරීම හේතුවෙන් අතිරික්තය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වමි . | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඊ) | 2020 වර්ෂයේ මිලදී ගත් රු.716,652 ක් වටිනා ස්ථාවර වත්කම් ලෙජරයට පිටපත් කිරීමේදී අදාළ ස්ථාවර වත්කම් ගිණුම්වලට ගිණුම්ගත වී නොතිබුණි. | 2021 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 331,691,844 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.58,109,485 ක් විය

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිඟ වරිපනම් බදු අයකිරීම සඳහා හඳුනාගත් දේපළ ප්‍රමාණය 29995 ක් වූ අතර වසර 03 ත් 05 ත් අතර නොගෙවූ වරිපනම් රු.10,879,644 ක් සහ වසර 05 හෝ ඊට වැඩියෙන් නොගෙවූ වරිපනම් බදු රු.16,544,837 ක් පැවතුණි. එම මුදල් අයකර ගැනීමට සුදුසු ක්‍රියාමර්ග ගෙන නොතිබුණි. | වසර 3 ත් 5 ත් අතර නොගෙවූ වරිපනම් බදු අය කර ගැනීමට දේපළ තහනම් කිරීමේ නිළධාරීන් හා ආදායම් පරීක්ෂක නිළධාරීන් යොදවා ඇත. | හිඟ වරිපනම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඩ කුලී ගිවිසුම අනුව බදුකරු මාස 06 කට අධික කාලයක් කුලී ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් කුලී ගිවිසුම ඒකපාර්ෂිකව අවලංගු කිරීමේ බලය නගර සභාව සතු වුවත් මාස 6 සිට අවුරුදු 3 දක්වා රු.7,058,936 ක කුලී ප්‍රමාද වූ කඩ කාමර 109 ක කුලී ගිවිසුම් අවලංගු කර එම කඩ කාමර නගර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නඩු කටයුතු සඳහා ලිපිගොනු සහා නීතිඥවරුන් වෙත භාරදී ඇත.<br>රටේ පවතින කොරෝනා තත්ත්වය මත උසාවි කටයුතු ප්‍රමාද වී ඇත. | කුලී ගිවිසුම් අනුව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | නාවින්න ක්‍රීඩාංගනය අත්පත් කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ප්‍රවර්තන වර්ෂයේදී රු.13,717,577 ක් ඇතුළුව එකතුව රු.24,554,972 ක් සභාව විසින් ගෙවා තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඔප්පුවක් මගින් පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීම් කර ඇත. මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කර ඇත. | පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. |